
කේළතිතීයයි
ජානකී සුර්යආරච්චි

álsß m%ldYlfhda

1490/8, **හෝකන්දර පාර**, **පන්නිපිටිය**.
Tel: 2847438, E-mail: janu@tikiri.com,
Web: www.tikiri.com

# කේන්ති කීයද?




කතාව චිත්‍ර

පරිගණක අක්ෂර සහ වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**

ප්‍රථම මුද්‍රණය - 2008

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-56-2
**Book Ref: T/08/143**

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තූතිය !**

මගේ පොත් වල අඩුපාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, "හරිම කරදරේ" කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තූතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
01-08-2008

# කේන්ති කීයද?

"චූටි" පුංචි ගැනු ළමයෙක්. එයාට හිටියෙ අක්කයි, අයියයි.
චූටි දෙන්නටම හරි ආදරෙයි.
ඒත් සමහර වෙලාවට එයාට ගොඩක් කේන්ති යනවා.
අයියා විහිළු කරනකොට කේන්ති වැඩි වෙනවා.
ඉවසගන්නම බැරි වෙනවා.



දවසක් චූටිගෙ තාත්තා එයාටයි අක්කාටයි ලස්සන
බෝනික්කෙක් ගෙනත් දුන්නා.
"ඔන්න රණ්ඩු නොවී දෙන්නම සෙල්ලම් කරන්න ඕනේ."
තාත්තා කීවා.
චූටි හරි ආසයි බෝනික්කාට. බිම තියන්නවත් හිතුණෙ නෑ.
අක්කා ඉල්ලුවත් දුන්නෙ නෑ. ඒ තරමට ආසයි.
ඒත් අක්කටත් ඒ තරමටම ආසා හිතෙනවා ඇති
නේද, කියලා නම් චූට්ටිට හිතුණෙ නෑ.
ඒ නිසා චූටි අක්කා එක්ක නිතරම රණ්ඩු වුණා.



එක දවසක් චූටි උදේ ඉඳන් බෝනික්කා එක්ක සෙල්ලම් කළා. අක්කත් සැරෙන් සැරේ ඇවිත් බෝනික්කා ඉල්ලුවා. ඒත් දුන්නෙ නෑ. තනියම සෙල්ලම් කරන්න තමයි චූටිට හිතුණෙ. එයා හවස් වෙනකල්ම සෙල්ලම් කළා. අක්කට දුන්නෙම නෑ.

"මමනෙ චූටි. ඒ නිසා බෝනික්කා අයිති මටයි." චූටි කීවා.

"නෑ චූටි දූ, අක්කත් තවම චූටියිනෙ. ඔයා වගේම එයාත් ආසයි බෝනික්කට. ඒ නිසා අක්කටත් ටිකක් දෙන්න සෙල්ලම් කරන්න." අම්මා ආදරෙන් කීවා. ඒත් චූටි බෝනික්කා දුන්නෙ නම් නෑ.

හවස අක්කා ඇවිත් බෝනික්කා උදුරාගත්තා. දෙන්නා රණ්ඩු වුණා. චූටි අක්කාට පාරක් ගැහුවා. ඒත් අක්කා බෝනික්කා ආපහු දුන්නෙ නෑ. චූටිට හොඳටම කේන්ති ගියා. කට ඇද වුණා, කන් රතු වුණා, මූණ කැත වුණා.



"චූටී!.ඔයා මුළු දවසම සෙල්ලම් කළා. දැන් අක්කගෙ වාරේ!"
අම්මා සැර කළා.
චූට්ට තවත් තරහා ගියා.
ඇස් දෙක ලොකු ලොවි ගෙඩි දෙකක් වගේ වුණා.
රෝස මලක් වගේ තිබුණු ලස්සන මූණ
බාගෙට කරවුණු පපඩමක් වගේ වුණා.
චූටිගෙ මූණ දිහා බලාගෙන හිටි අයියාට එකපාරටම
"හිච්ස්" ගාලා හිනා ගියා.
"එනව මෙතන හිනාවෙන්න!" චූටි අයියාට රැව්වා.
අයියගෙ හිනාව වැඩි වුණා.



"ඔන්න දැන් අපේ චූටි පිපිරෙන්න යන්නේ. කේන්තිය වැඩිවේගෙන වැඩිවේගෙන එනවා. එකයි - දෙකයි - තුනයි - හතරා---යි---"
අයියා හයියෙන් කියන්න පටන්ගත්තා.
චූටිගෙ කේන්තිය තවත් වැඩි වුණා.
පුටුව පෙරළන්න හිතුණා. මේසෙ පෙරළන්න හිතුණා.
මුළු ලෝකෙම පෙරලලා දාන්න හිතුණා.
එයා ළඟ තිබුණු සෙල්ලම් බඩු පෙට්ටියට පයින් ගැහුවා.
"හරි --- විසි පහයි, විසි හයා--යි--, විසි නමයා--යි, තිහා----යි"
අයියා චූටිගෙ කේන්තිය ගණන් කළා. චූටි අයියගෙ පස්සෙන් එළෙව්වා. අයියා හිනා වෙවී ගේ වටේම දුවලා වයිටාගේ බලු කූඩුව උඩට නැග්ගා.



චූට්ට බෝනික්කා නැති වුණාටත් වඩා, දැන් කේන්තියි.
මුළු ඇඟම රත්වෙලා පිපිරෙන්න වගේ දැනුණා.
වයිටා පිඟාන අස්සෙ මූණ හංගාගෙන
හොරැහින් බලාගෙන ඉන්නවා.
ඒකාත් හිනාවෙනවද? චූට්ට බලු කූඩුවත් පෙරලලා දාන්න හිතුණා.
"පනස් අටයි - පනස් නමයයි - හැටා----යි"
අයියා බලු කූඩුව උඩ ඉඳගෙන කෑගහනවා. දැන් චූටිගෙ කේන්තිය
විහිළුවක් වෙලා. තාත්තාත් හිනා වෙවී ජනේලයෙන් එබුණා.
"මොකද චූටි! කේන්ති කීයද?"
ඒ සැරේ තාත්තාත් චූටි විහිළුවට අරගෙන.
"හැත්ත පහයි!" ඒකට උත්තර දුන්නෙ අයියා.
කිව්වත් වගේ චූටිගෙ කේන්තිය තවත්
දොළහකින් විතර වැඩි වුණා.



"ඔන්න දැන් අපේ චූටිගෙ කේන්තිය තවත් නැගගෙන නැගගෙන
එනවා. පිපිරෙන්න ආසන්නයි, ඔන්න පිපිරුණා, මෙන්න
පිපිරුණා" අයියා බලු කුඩුව උඩ ඉඳගෙන මහ හයියෙන්
කෑගහනවා. එහා ගෙදර සුදු අක්කාත් තාප්පෙන් එබිලා බැලුවා.
වස ලැජ්ජාව ! චූටිට කෑගහලා අඬන්න හිතුණා.
අයියගෙ කමිසයෙන්වත් අල්ලගන්න විධියක් නෑ.
බලු කුඩුව උඩට අත දිග නැහැනෙ.
"අසූ නමයයි--අනූවා---යි" අයියා කෑගහනවා.
"දැන් නංගිව තවත් කේන්ති නොකර ඉන්න පුතා."
අම්මා හිනා වෙවී අයියාට කීවා.
අම්මාට හිනා ගිය එකටත් චූටිගෙ කේන්තිය වැඩි වුණා.
හැමෝම දැන් චූටි දිහා බලාගෙන ඉන්නවා.



ඤාච්චා මල්පෝච්චිය අස්සෙ හැංගිලා බලාගෙන ඉන්නවා.
ඤාච්චාත් හිනා වෙනවද දන්නෙ නෑ.
චූට්ට කේන්තිය තවත් නම් ඉවසගන්නම බැරි වුණා.
"මට එපා ඔයාලා හැමෝම ! මම තරහයි ඔයාල ඔක්කොම එක්ක!"
චූටි ළඟ තිබුණු මල් පෝච්චියත් පෙරළලා යන්න ගියා වත්ත පහළට.
"පිපිරුණා-- පිපිරුණා---අනූ නමයයි - සීයා----යි-----ඩෝ--ං!"
අයියා මහ හයියෙන් කෑගැහුවා.
"එයාටත් කේන්ති යන දවසක් එයිනෙ.
එදාට මම අල්ලගන්නම්කො."
චූටි කේන්තියෙන් ඇවිදගෙන ගිහින්
වත්ත කොනේ පිනිජම්බු ගහ යටින් වාඩිවුණා.
කේන්තිය වැඩිකමට මොනවා කරන්නද කියලා
චූට්ට හිතාගන්න බෑ.
ලැජ්ජයි, කේන්තියි, හිතට අමාරුයි.



චූටි පිනි ජම්බු ගහ දිහා බලාගෙන කේන්තියෙන් කල්පනා කළා.
පිනි ජම්බු ගහේ මල් පිපිලා, ගෙඩි හැදිලා හරිම ලස්සනයි.
මල් රේණු බිමට වැටිලා බිමත් ලස්සනයි.
"පිනි ජම්බු මල් කීයක් තියෙනවද දන්නෙ නෑ."
ටිකක් වෙලා ඉන්නකොට චූටිට
පිනි ජම්බු මල් ගනින්න හිතුණා.
"එකයි - දෙකයි - තුනයි --- අහ්, වැරදුණා."
ලේන් අප්පු කෙනෙක් අතු සොලවනවා.
චූටිට ගණන් වරදිනවා. පිනි ජම්බු රේණු
චූටිගෙ ඇඟටත් වැටෙනවා.
ලේන් අප්පු පිනි ජම්බු ගෙඩියෙ එල්ලුණු හැටි දැකලා
චූටිට හිනාත් ගියා. තව චුට්ටෙන් බිමට වැටෙනවා.
"හි - හි - හි - " චූටිගෙ කේන්තිය චූටිටත් හොරා
අමතක වේගෙන ගියා. චූටිගෙ මූණ ආයෙත් ලස්සන වෙලා.
වත්ත පහළ එරබදු ගස් අතරින්
සීතල සුළඟක් හමාගෙන ආවා.
චූටිගෙ හිතට අමුතු සනීපයක් දැනුණා.



ඉර බැහැගෙන ගියා. කුරුල්ලො පියාඹලා කූඩුවලට ගියා.
ටිකෙන් ටික කළුවර වැටුණා. චූටි වට පිට බැලුවා.
"අහ්! මං මොකද මේ මෙතනට වෙලා ඉන්නෙ?" චූටි කල්පනා කළා.
"ආ, මං අද හවස අක්කා එක්ක රණ්ඩු කළානෙ."
චූටිට මතක් වුණා.
"ඇයි මං රණ්ඩු කළේ, අක්කා එක්ක?" චූටි එයාගෙන්ම අහගත්තා.
"අක්කා බෝනික්කා උදුරගත්තු නිසා." චූටිම උත්තර දුන්නා.
"ඇයි අක්කා උදුරගත්තෙ?" චූටි ආයෙත් එයාගෙන් අහගත්තා.
"මම දුන්නෙ නැති නිසා." චූටිම උත්තර දුන්නා.
"ඇයි දුන්නෙ නැත්තෙ?" චූටි ඇහුවා.
"ම්-----" චූටි කල්පනා කළා.



"----මම උදේ ඉඳන් බෝනික්කා එක්ක සෙල්ලම් කළා. අක්කට දුන්නෙම නෑ. අක්කත් ආසයිනෙ බෝනික්කට. අක්කා පව්! මං අක්කට ගැහුවා. රිදුනද දන්නෙ නෑ. කේන්ති ගියාට කාටවත් ගහන්න හොඳ නෑ. ගිහින් බලන්න ඕනෙ." චූට්ට දුක හිතුණා.
"අහ්, ඒත් දැන් කොහොමද ගෙදර යන්නෙ? රණ්ඩු වෙලානෙ ආවෙ." චූට්ට හවස රණ්ඩුව මතක් වුණා.
"ගෙදර ගියාම ඒ ගැන මතක් කරලා හැමෝම විහිළු කරයිද දන්නෙ නෑ. මට හිනා වෙයිද දන්නෙත් නෑ. ච්හ්! අපරාදෙ රණ්ඩු වුණේ !" චූට්ට ලැජ්ජා හිතුණා.
"හෙමින් හෙමින් යන්න ඕනෙ බලන්න."



චූටි හෙමින් ගිහින් ගෙට ඇතුල් වුණා.
අක්කා බෝනික්කා එක්ක සාලෙ මැද.
"ආ නංගි, එන්න සෙල්ලම් කරන්න---" අක්කා අඬ ගැහුවා.
"ආ මෙන්න නංගිට!" අක්කා චූට්ට බෝනික්කා දුන්නා.
"අක්කා තරහා නෑ වගේ. අනේ පව්! අපරාදෙ මම අක්කා එක්ක රණ්ඩු කළේ. මමත් මේ වගේ එයාට දුන්නා නම් කොච්චර හොඳද?" චූටි හිතුවා.
"චූටි දූ කොහෙද ගියේ, මම ලැවරියා හැදුවා. එන්න කන්න."
අම්මා දොරෙන් එබිලා අඬ ගැහුවා.
"ම්---කිසිම වෙනසක් නෑ. අම්මටත් රණ්ඩුව මතක නෑ වගේ."
චූට්ට හරි සතුටු හිතුණා. චූටි කුස්සියට එබුණා.



අයියා ලැවරියා පිඟාන බදාගෙන කනවා.
"අයියෝ, ආයෙත් විහිළුව පටන්ගනවිද දන්නෙ නෑ."
චූටිගෙ මූණ ඇඹුල් වුණා.
"චූටි නංගී, ඔයාට ලැවරියා අගුණයි. කන්නෙ නැත්නම් මට දෙන්න"
අයියා ලැවරියා ලොරියක් විතර කටේ පුරවාගෙන කීවා.
"අයියාටත් මතක නෑ වගේ."
ඊළඟට තාත්තා කුස්සියට එබුණා.
"ආ, චූටි දූ! අපි කමු ලැවරියා."
තාත්තා චූටිත් එක්කම මේසෙට වාඩිවුණා.
හැමෝම වටවෙලා හිනා වෙවී ලැවරියා කෑවා.
චූට්ට හවස කේන්ති ගිය එක ගැන කවුරුවත්
ආයෙත් මතක් කළේ නෑ.



"රණ්ඩු ඉක්මනින් අමතක කරලා දාන එක කොච්චර හොඳයිද? මේ හැමෝම මට ආදරෙයිනෙ. අපරාදෙ මම කේන්ති ගත්තෙ. කේන්තිය හොඳ නෑ. ඇඟට අමාරුයි, හිතට අමාරුයි, ලැජ්ජයි. ඒ නිසා මීට පස්සෙ හැමදේටම හිනා වෙලා ඉන්න ඕනෙ."
චූටි ලැවරියා කන ගමන් හිතුවා.

එතකොට කේන්ති කීයද?

බිංදුවයි !
"හි - හි - හි -"

